# වැඩිහිටි නිවාසයන්හි රැකවරණය ලබන වැඩිහිටියන්ගේ ආර්ථික පසුබිම පිළිබඳ සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක්

**එදිරිසිංහ එස්. එම්.[1], සමරකෝන් එම්.[2], විජේවර්ධන බී. වී. එන් [3]**

**Edirisinghe SM[1] Samarakoon MT[2], Wijewardhana BVN [3]**

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

*sandyamedirisinghe@gmail.com[1], neranji@sjp.ac.lk[3]*

**සාරාංශය**

*ප්‍රජා විද්‍යාත්මක වශයෙන් වැඩිහිටි ජනගහනය වර්ධනය වීම නිසා, වයස්ගත වීමත් සමග වැඩිහිටි නිවාසවල රැකවරණය සඳහා යොමු වීමේ ප්‍රවනතාවයක් දැකගත හැකිය. මෙහිදී වයස්ගතවූවන් වැඩිහිටි නිවාසයන්හි රැකවරණයට යොමු වීම සඳහා විවිධ සාධක බලපාන බව පෙනෙයි. දෙමාපියන්ගේ රැකවරණය යටතේ සිටි අවිවාහකයින්, දෙමාපියන්ගේ මියයාමත් සමඟ සිය ජීවිත අස්ථාවරත්වයට පත්වීම, වැන්දඹුවන් සිය සැමියා හෝ බිරිඳ මියයාමත් සමඟ සමාජීය වශයෙන් හුදකලාභාවයට පත්වීම, දරුවන් නොමැති වීම, සිය දරුවන්ගේ ආර්ථික ශක්තිය දුර්වල වීම හරහා දරුවන් නො සළකා හැරීම සහ කුටුම්භයන්හි සිදුවන විවිධ ආරවුල් මත සහ තනිවම ජීවත් වීමට තරම් ආර්ථික සුරක්ෂිතතාවයක් නොමැති වීම යන සාධක ප්‍රබල වශයෙන් මෙම සමාජ ප්‍රශ්නය තීව්‍ර වීමට හේතු වී ඇත. එනමුත් මෙම සාධක අතුරින් ආර්ථික සුරක්ෂිතභාවයක් නොමැතිකම ප්‍රධාන ගැටලුවක් බවට පත් වී ඇත. මෙම අධ්‍යයනයේ දී ප්‍රධාන අරමුණ වශයෙන් වැඩිහිටි නිවාසගතවීම කෙරෙහි ඔවුන්ගේ ආර්ථික පසුබිම බලපාන ආකාරය විමර්ෂණය කරන ලදී. තවද මෙහි උප අරමුණු වන්නේ වැඩිහිටි නිවාසගතවන්නන්ගේ රැකියාවේ ස්වභාවය, ආදායම් සහ වත්කම් පිළිබඳ අධ්‍යයනය කිරීම, ඔවුන් මුහුණ දෙන ආර්ථික ගැටලු සොයාබලා ඒවා අවම කර ගැනීමට ගතහැකි ක්‍රියාමාර්ග යෝජනා කිරීම මෙන්ම වයස්ගතවූවන්ගේ රැකවරණය උදෙසා පුළුල් වූ ජාතික වැඩපිළිවෙලක් සඳහා අදහස් හා යෝජනා ඉදිරිපත් කිරීම ය. මෙහිදී අධ්‍යයන ක්ෂේත්‍රය වශයෙන් බස්නාහිර පළාතේ පිහිටි තෝරාගත් වැඩිහිටි නිවාස තුනක් තෝරා ගැනීමේ දී රාජ්‍යය, පෞද්ගලික මෙන්ම ආගමික වශයෙන් මීරිගම සෙත්සෙවන රජයේ වැඩිහිටි නිවාසය, සහන උයද වැඩිහිටි විවේකාශ්‍රය සහ සුජාතා වැඩිහිටි නිවාසය යොදා ගන්නා ලදී. මෙම පර්යේෂණයේ දී දත්ත ලබා ගැනීම සඳහා උපයෝගී කොටගනු ලැබූ පර්යේෂණ ක්‍රමවේදය වන්නේ සම්භාවිතා නියැදි ක්‍රමයට අයත් උප නියැදි ක්‍රමයක් වන ස්ථර නියැදි ක්‍රමය යොදා ගනිමින් සමස්ථ සංගහනයෙන් අහඹු ලෙස තෝරාගත් වැඩිහිටියන් 66ක් නියැදිය වශයෙන් සියලු දෙනා නියෝජනය වන පරිදි යොදා ගන්නා ලදී. තවද සම්මුඛ සාකච්ඡා, නිරීක්ෂණය මෙන්ම ප්‍රශ්නාවලී යන ක්‍රමවේද මගින් ප්‍රමාණාත්මක දත්ත මෙන්ම ගුණාත්මක තොරතුරු එක්රැස් කරන ලදී. පර්යේෂණ දත්ත විශ්ලේෂණයේ දී බහුතරය දේපල හා වත්කම් අහිමි වූ පිරිස් ය. එය ප්‍රතිශතයක් වශයෙන් 63.6%ක් වේ. මෙම වැඩිහිටි ප්‍රජාව අතුරෙන් දෙමාපියන්ගේ වත්කම් හා දේපළ හිමිව තිබූ අය 6.1%ක් පමණ වේ. ඉඩම් හිමිවූවන් 16.7%ක් පමණ වේ එමෙන්ම වෙනත් වත්කම් හිමි අය 13.6%ක් වශයෙන් හඳුනාගත හැකිය. මෙම විවිධ සමාජීය සාධක අතුරින් වයස්ගතභාවයට පත්වීම හරහා වැඩිහිටි නිවාස කරා යොමු වීමට ප්‍රධාන වශයෙන් ඔවුනගේ ආර්ථික අස්ථාවරත්වය බලපා ඇත. එහිදී ආදායම්, වත්කම් මෙන්ම දේපල අහිමි වීම හරහා උත්පන්න වී ඇති ආර්ථික සුරක්ෂිතතාවයෙන් තොර වීම මෙම ගැටලුව උග්‍ර වීමට හේතු වී ඇත.*

*මුඛ්‍ය පදඃ ආර්ථිකය, දේපල, වත්කම්, වැඩිහිටි නිවාස, සුරක්ෂිතභාවය*

## 1. හැඳින්වීම

"වියපත් වීම විග්‍රහ කරනු ලබන එක් ආකාරයක් වනුයේ එය වෙනස් වීම තුළ නොනවත්වා සිදුවන ක්‍රියාවලියක් සහ කාලයත් සමඟ වර්ධනය වන දෙයක් ලෙසයි. ඇතැම් අවස්ථාවල දී මෙය ජීවන චක්‍රය ලෙස ද හඳුන්වයි. මෙම චක්‍රීයව ගලා යන ජීවිතය පිළිබඳ අදහස සාමාන්‍යයෙන් සතුන් තුළ ප්‍රජනනය සිදුවීමේ ක්‍රියාවලිය ලෙස එනම් උපත, වර්ධනය, ප්‍රජනනය හා මරණය වශයෙන් සිදුවන ආකාරය ප්‍රායෝගිකව දැකගත හැකිය" (Brearley, 1990, 21, 22). මෙහිදී පෙනී යන්නේ වියපත් වීම යන්න ජීවන චක්‍රය තුළ දී ජීවිතයේ එක් අවධියක් වන බවයි. සියලු දෙනා උපත සමඟ ක්‍රමයෙන් වියපත් බවට වර්ධනය වන ආකාරය මේ අනුව අපට පසක් වෙයි. එමෙන්ම මෙම වියපත් වීමේ ක්‍රියාවලිය චක්‍රීයව ගලා යන ජීවිතය තුළ දැකිය හැකි සංසිද්ධියක් වශයෙන් ද හඳුනාගත හැකිය. ලෝකයේ වැඩිහිටි ජනගහනය වර්ධනය වීමේ ප්‍රවනතාවයක් වර්තමානය වන විට පවතින අතරම මෙසේ වැඩිවන වැඩිහිටි ජනගහනය රැකබලා ගැනීමට සිටින තරුණ හා බාල වයස් කාණ්ඩවල ප්‍රතිශතය අඩු වීමත් සමාජීය සහ ආර්ථික වෙනස්කම් මැද ඔවුනට මුහුණ පාන්නට සිදුවන

විවිධ ගැටලුත් නිසා වැඩිහිටි රැකවරණය කෙරෙහි මැදිහත්වීම අත්‍යාවශ්‍ය වී ඇත. විශේෂයෙන්ම සාම්ප්‍රදායානුකූලව පැවති පවුල් ක්‍රමය අනුව එකම පවුලේ පරම්පරා දෙක තුනක සාමාජිකයන් ජීවත් වීම නිසා වැඩිහිටියන් රැක බලා ගැනීම අප වැනි පෙරදිග රටවලට ප්‍රශ්නයක් වී නොතිබුණි.

නිවසින් ඉවත්වන වැඩිහිටියාට රැකවරණය සැපයීමේ කාර්යයේ දී විකල්පය වූයේ වැඩිහිටි නිවාසය. රජයේ වැඩපිළිවෙල යටතේ රැකවරණයකින් තොරව අසරණ වූ වැඩිහිටි දෙමාපියන්ට අඩුම තරමේ පෝෂණය හෝ රැකවරණය හෝ ලබා දීමේ අරමුණෙන් වැඩිහිටි නිවාස හඳුන්වා දී තිබෙයි. "වැඩිහිටි නිවාස යනුවෙන් හඳුන්වන්නේ මහලු වීම නිසා අසරණ වී කිසිවකුගේ රැකවරණයක් නොමැතිව සිටින පුද්ගලයන් රැක බලා ගැනීම හා ඔවුන්ගේ සුභ සිද්ධිය සැපයීම සඳහා රජයෙන් පවත්වාගෙන යන වැඩිහිටි නිවාස යි" (ලියනගම, 1993, 41). ශ්‍රී ලාංකීය සමාජය තුළට වැඩිහිටි නිවාස ආගන්තුක සහ නුහුරු සංකල්පයක් විය. එසේ නමුදු සමාජ අවශ්‍යතා දෙස බැලීමේ දී, වර්තමාන සමාජය තුළට වැඩිහිටි නිවාස යම් පමණකට සමාජ අවශ්‍යතාවයක් වී ඇති බව පෙනී යයි. සමාජය කිසිම විටක එකම තැන රඳන තත්ත්වයේ නො පවතියි. සමාජ රැකවරණය ලැබූ වැඩිහිටියන් න්‍යෂ්ටික පවුල් ක්‍රමය තුළ දී අනාරක්ෂිත සහ රැකවරණය නො ලබන පිරිසක් බවට පත් වී තිබෙයි. "සංක්‍රමණය නාගරීකරණය සහ වැඩි ස්ත්‍රී ශ්‍රම බලකා සහභාගීත්වය වැනි සමාජ වෙනස්කම් යන්නෙන් අදහස් වන්නේ පවුලේ පරම්පරාවන් විවිධ ස්ථානවල ජීවත් විය හැකි බවත් පරම්පරා කිහිපයක පවුලකට ඉඳුම් හිටුම් දීමට තරම් ප්‍රමාණවත් නොවන ස්ථානයක ඔවුන් ජීවත් විය හැකි බවත්ය. එබැවින් ශ්‍රී ලාංකික පවුල්වලට අතීතයේදී මෙන් සිය වයස්ගත සාමාජිකයන්ට සැලකිය නොහැකිය. එබැවින් ජන සංඛ්‍යාව වයස්ගත වීමේ ප්‍රතිඵලයක් වශයෙන් පැන නගින ඉතාමත් වැදගත් ප්‍රතිපත්ති කරුණක් වන්නේ වයස්ගතවුවන්ට කොතරම් හොඳින් ආර්ථික උපකාරය ලබා දිය හැකිද යන්නය" (සිල්වා, 2008, 4). මෙහිදී අපට පසක් වන්නේ මෙම නාගරීකරණය නවීකරණය වැනි සමාජ වෙනස්වීමේ ක්‍රියාවලීන් නිසා වැඩිහිටි රැකවරණය පිළිබඳ විවිධාකාරයේ අභියෝගවලට ලෝකයේ බොහෝ රාජ්‍යන්ට මුහුණ දීමට සිදු වී ඇති බවයි. සිය වැඩිහිටි සාමාජිකයන්ට සැලකීම පවුලේ වගකීම යයි බොහෝ පෙරදිග රටවල මිනිසුන් විශ්වාස කරති. එමෙන්ම රජයෙන් වැඩිහිටියන්ට අනුග්‍රහය හා උපකාර අවශ්‍ය වන්නේ යයි බොහෝ බටහිර හා පෙරදිග රටවල මිනිසුන් බලාපොරොත්තු වෙති. මන්ද වියපත් වීමත් සමඟ යැපෙන්නන් බවට පත්වන වැඩිහිටියන්ගේ රැකවරණය සලසා ගැනීමේදී ආර්ථික වශයෙන් ස්ථාවරත්වයක් නොමැතිකම වැඩිහිටි නිවාසගත වීම කෙරෙහි බලපාන ආකාරයක් හඳුනාගත හැකිය.

වර්තමානයේ ආයතනගත වී ඇති වියපත්වූවන් දෙස බැලීමෙ දී කිසිදා විවාහ වූ වැඩිහිටි පුද්ගලයන් මෙන්ම කිසිදා විවාහ නොවූ වැඩිහිටි පුද්ගලයන් ද දැකිය හැකිය. කිසිදා විවාහ නොවූ වැඩිහිටියන් බහුතරයක් රැකබලා ගැනීමට කිසිවෙකු නොමැති වීම නිසා සහ ආර්ථික වශයෙන් කිසියම් සුරක්ෂිත බවක් නොමැති නිසා ඔවුහු ආයතනගත වෙති. ආයතනගත වීමට පෙර සිය දෙමාපියන් සමඟ වාසය කළ ද දෙමාපියන්ගේ මියයාමත් සමඟ රැකබලා ගැනීමට කිසිවෙක් නොමැති වීම සහ මුදල් ඉපයීමට තරම් ශරීර ශක්තියක් නොමැති වීමත්, මෙම ආර්ථික පසුබිම නිසා කිසිවෙකුත් රැකබලා නොගැනීම නිසාත් බහුතරයක් ආයතනවල රැකවරණය ලබා ගැනීමට යොමු වී තිබෙයි. එමෙන්ම විවාහ වූ වැඩිහිටියන් කාලාත්‍රයා අහිමි වීම, දරුවන් නොමැති වීම, දරුවන්ට ආර්ථික ශක්තියක් නොමැති වීම, දරුවන් නො සළකා සිටීම සහ පවුල තුළ රැකබලා ගැනීමට නො හැකි වීම නිසා සහ තනිවම ජීවත් වීමට තරම් ආර්ථික සුරක්ෂිතතාවයක් නොමැති වීම නිසාද ආයතනගතව රැකවරණය ලැබීමට යොමු වී තිබෙයි. තවද දෙමාපියන් වියපත් වූ පසු ඔවුන්ගේ මුදල් සහ දේපල දරුවන් විසින් පරිහරණය කිරීමට පටන් ගැනීමත් සමඟ ආර්ථික රැකවරණයක් නොමැති වීම නිසා වැඩිහියටි නිවාසගත වන ආකාරයක් ද දැකගත හැකිය. මේ ආකාරයට විමසා බලන විට අපට පෙනී යන්නේ වැඩිහිටි රැකවරණය පිළිබඳ ගැටලුව කෙරෙහි ආර්ථික සාධකය මගින් බලපෑමක් සිදු කරනු ලබන බවයි. එබැවින් වැඩිහිටි නිවාසගතවීම කෙරෙහි ඔවුන්ගේ ආර්ථික පසුබිම බලපාන

ආකාරය මෙහිදී අධ්‍යයනය කිරීම කාලීන අවශ්‍යතාවයක් වන බව මෙහි ලා සඳහන් කිරීම වටියි.

**1.1. අධ්‍යයන ගැටලුව**

ප්‍රජා විද්‍යාත්මක වශයෙන් වැඩිහිටි ජනගහනය වර්ධනය වීමේ ප්‍රවනතාවයක් ඇති වීම නිසා වෙනස් වන සමාජ රටාවත් සමඟ වැඩිහිටි නිවාස ගතවන්නන්ගේ ප්‍රමාණය ද ඉහළ යාමක් දක්නට ලැබෙන අතර, වැඩිහිටි නිවාසගත වීම කෙරෙහි ඔවුන්ගේ ආර්ථික පසුබිම බලපාන්නේ කෙසේද? යන්න පිළිබඳ විමසීමක් මෙම අධ්‍යයනය මඟින් සිදු කරනු ලබයි.

**1.2. ප්‍රධාන අරමුණ**

වැඩිහිටි නිවාසගතවීම කෙරෙහි ඔවුන්ගේ ආර්ථික පසුබිම බලපාන ආකාරය විමර්ෂණය කිරීම මෙම අධ්‍යයනයේ අරමුණයි.

**1.3. සුවිශේෂී අරමුණු**

වැඩිහිටි නිවාසගතවන්නන්ගේ රැකියාවේ ස්වභාවය, ආදායම් සහ වත්කම් පිළිබඳ පුළුල්ව අධ්‍යයනය කිරීම.

ඔවුන් මුහුණ දෙන ආර්ථික ගැටලු සොයාබලා ඒවා අවම කර ගැනීමට හැකි ක්‍රියාමාර්ග යෝජනා කිරීම.

වයස්ගතවූවන්ගේ රැකවරණය උදෙසා පුළුල් වූ ජාතික වැඩපිළිවෙලක් සඳහා අදහස් හා යෝජනා ඉදිරිපත් කිරීම.

**1.4. සහිත්‍ය විමර්ෂණය**

2003 --2004 වර්ෂයන්වල දී National Survey on Elders යනුවෙන් සමීක්ෂණයක් National Secretariat For Elders of Ministry of Women's Empowerment & Social Welfare නම් ආයතනය මගින් සිදුකර ඇත. මෙහිදී වියපත් වීම සම්බන්ධ ප්‍රජා විද්‍යාත්මක වශයෙන් පුළුල් ලෙස සමීක්ෂණයක් සිදුකොට ඇත. මෙමගින් වැඩිහිටි නිවාස පිළිබඳ ප්‍රශ්නය ගැන සාකච්ඡා කොට නොමැති වුවත් වැඩිහිටිවිය ගත කරන අයගේ ආර්ථික සමාජ පසුබිම සහ ඔවුන් මුහුණ දෙන ගැටලු පොදුවේ හඳුනා ගැනීමට වෙර දරා ඇත.

තවද ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය විසින් "අඩු ආදායම්ලාභී වැඩිහිටියන් සඳහා ක්‍රියාත්මක කරනු ලබන රුපියල් 2000/- දීමනා වැඩසටහන ප්‍රතිලාභීන්ගේ සමාජ ආර්ථික යහපැවැත්ම සාධනය කෙරෙහි බලපෑ ආකාරය හා ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ ජීවන තත්ත්වය දරණීය ලෙස පවත්වාගෙන යාම උදෙසා ගතයුතු ක්‍රියාමාර්ග හඳුනා ගැනීම" ලෙස 2016 පර්යේෂණයක් සිදුකර ඇත. ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට ආර්ථික සුරක්ෂිතතාවයක් ලබා දීම මගින් ඔවුන්ට එම ආධාර ලබා දීමේ හේතුව පදනම් කරගෙන හෝ ආයතනගත නොවී සිටීමට සහ නිවස තුළ රැඳී සිටීමට අවශ්‍ය වාතාවරණය සලසා දීම මෙහි ප්‍රධාන අරමුණු අතර විය. මෙහිදී ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ සමාජ හා ආර්ථික සුරක්ෂිතතාවය අරමුණු කර ගනිමින් මෙම පර්යේෂණය සිදු කර ඇති අතර වැඩිහිටි ජනගහනයේ සමාජ ආර්ථික පසුබිම පිළිබඳව විග්‍රහයක් ඉදිරිපත් කර ඇත.

The Science of Caring for Elders නමින් Vasanthy Thevarajah Shrisgarajah විසින් පර්යේෂණ කෘතියක් සම්පාදනය කොට ඇත. වැඩිහිටියන් පිළිබඳ හඳුනාගෙන ඔවුන්ගේ මානසික ගැටලු ආදිය අවම කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග ආදිය මෙම කෘතිය හරහා විවරණය කොට ඇත. එහිදී මෙම කෘතියෙහි හත් වන පරිච්ඡේදයෙහි Nursing Homes and Elders ලෙස ගනිමින් වැඩිහිටි හෙද නිවාසයන් පිළිබඳ සහ වැඩිහිටියන් රැකබලා ගන්නා නිවාස පිළිබඳ විග්‍රහයක් ඉදිරිපත් කර ඇත. එමෙන්ම ශ්‍රී ලංකාවේ උතුරු පළාතේ යාපනය

දිස්ත්‍රික්කයේ පිහිටා ඇති කයිතඩි ශාන්ති වැඩිහිටි නිවාසය ඇසුරින් සිද්ධි අධ්‍යයනයක් ද සිදු කරමින් වැඩිහිටි නිවාසගතවන්නන් මුහුණ දෙන ගැටලු පිළිබඳ පර්යේෂණය මගින් කරුණු විග්‍රහයක් සිදුකර ඇත.

Tiffani Easton, Rachel Milte, Moaria Crotty සහ Julie Ratdiffe යන පර්යේෂකයින් විසින් වැඩිහිටි නිවාසවල සිටින වැඩිහිටියන්ගේ භෞතික පරිසරය පිළිබඳ, වැඩිහිටි නිවාසයට පෙර පදිංචිය සහ ආර්ථික සාධකය පිළිබඳ විර්ශණයක් සිදුකොට ඇත. එමෙන්ම Christina Hagger විසින්ද මහලු වැඩිහිටියන් දීර්ඝ කාලීනව රැකවරණය අපේක්ෂාවෙන් සංක්‍රමණය වීමෙන් ලබන අත්දැකීම් ඇසුරින් පර්යේෂණයක් සිදු කොට ඇත. මෙහිදී පසක් වන කරුණක් වන්නේ වැඩිහිටි නිවාසගත වීම කෙරෙහි බලපාන සාධක පිළිබඳ සිදුකර ඇති පර්යේෂණ මඟින් ද අනාවරණය වන්නේ විවිධ සාධක වැඩිහිටි නිවාසගත වීමට හේතු වන ආකාරයයි. මෙම අධ්‍යයනය මඟින් සිදු කරනු ලබන්නේ වැඩිහිටි නිවාසගත වීමට ආර්ථික සාධකය මඟින් කරනු ලැබූ බලපෑම පිළිබඳව පුළුල්ව විවරණය කිරීමයි.

## 2. අධ්‍යයන ක්‍රමවේදය

### 2.1. අධ්‍යයන ක්ෂේත්‍රය

මෙම පර්යේෂණය සඳහා අධ්‍යයන ක්ෂේත්‍රය වශයෙන් ශ්‍රී ලංකාවේ පවතින වැඩිහිටි නිවාස අතුරින් තෝරාගත් වැඩිහිටි නිවාස තුනක් යොදා ගන්නා ලදී. එම වැඩිහිටි නිවාස තුන වන්නේ, මීරිගම සෙත්සෙවන රජයේ වැඩිහිටි නිවාසය (රජයේ වැඩිහිටි නිවාසයකි). සුජාතා වැඩිහිටි නිවාසය (පෞද්ගලික වැඩිහිටි නිවාසයකි). සහන උදය වැඩිහිටි විවේකාශ්‍රය (ආගමික වශයෙන් පවත්වාගෙන යන වැඩිහිටි නිවාසයකි) යන වැඩිහිටි නිවාස තුනයි.

### 2.2. නියදිය

මෙහිදී සමස්ත නියැදිය වශයෙන් මෙම වැඩිහිටි නිවාස තුනෙන් සම්භාවිතා නියැදි ක්‍රමයට අයත් උප නියැදි ක්‍රමයක් වන ස්ථර නියැදි ක්‍රමයට අනුව ක්ෂේත්‍රයට අයත් වැඩිහිටි නිවාස සියල්ලෙන්ම තෝරාගත් මෙම වැඩිහිටි නිවාස තුනකින් වැඩිහිටියන් 66 දෙනෙක් සමස්ත නියැදිය වශයෙන් සියලු දෙනා නියෝජනය වන පරිදි තෝරා ගැනීම සිදු කරනු ලැබීය.

### 2.3. දත්ත රැස් කිරීම

#### 2.3.1. ප්‍රාථමික මූලාශ්‍රය

මෙම අධ්‍යයනය සිදු කිරීමේ දී දත්ත සහ තොරතුරු එක්රැස් කිරීම සඳහා නිරීක්ෂණය, සම්මුඛ සාකච්ඡා, ප්‍රශ්නාවලී යන ක්‍රමවේදයන් ප්‍රාථමික මූලාශ්‍රය වශයෙන් භාවිත කරන ලදී.

#### 2.3.2. ද්විතීක මූලාශ්‍රය

ද්විතීක මූලාශ්‍රය වශයෙන් පොත්පත්, සඟරා, අන්තර්ජාලය සහ පුවත්පත් ආදීය භාවිත කරමින් පර්යේෂිකාව විසින් පර්යේෂණ මාතෘකාවට අදාලව පවතින දත්ත සහ තොරතුරු රැස් කිරීම මේ යටතේ සිදු කරන ලදී.


### 2.4. දත්ත විශ්ලේෂණය

දත්ත විශ්ලේෂණය කිරීමේ දී Excel, SPSS යන පරිගණක මෘදුකාංග හා දත්ත විශ්ලේෂණය කිරීමේ සංඛ්‍යාන විද්‍යාත්මක ක්‍රමවේද වශයෙන් වගු හා ප්‍රස්ථාර භාවිත කරමින් දත්ත විශ්ලේෂණය සිදු කරන ලදී.

## 3. සොයාගැනීම් සහ විශ්ලේෂණය

වැඩිහිටි නිවාසගත වීම කෙරෙහි බලපාන ආර්ථික සාධක පිළිබඳ විමර්ෂණය කිරීමේ දී දත්ත දායකයාගේ ස්ත්‍රී පුරුෂභාවය පිළිබඳ ප්‍රවනතාවය ගැන අවධානය යොමු කරන ලදී. ඒ අනුව දත්ත දායකයාගේ ස්ත්‍රී පුරුෂ බව පිළිබඳ ප්‍රවනතාවය පහත අංක 1 ප්‍රස්ථාරයේ දැක්වෙයි.

ප්‍රස්තාරය 1 : දත්ත දායකයින්ගේ ස්ත්‍රී පුරුෂභාවය





මූලාශ්‍රයඃ ක්ෂේත්‍ර පර්යේෂණය 2018

මේ අනුව දත්ත දායකයින්ගෙන් 41%ක් පුරුෂයන් වන අතර, දත්ත දායකයින්ගෙන් 59%ක් ස්ත්‍රීන් වශයෙන් හඳුනාගත හැකිය. මෙහිදී පෙනී යන්නේ දත්ත දායකයින්ගේ ස්ත්‍රී පුරුෂභාවය වෙනස් වීම මඟින් වැඩිහිටි නිවාසවල සිටින බහුතරයක් ස්ත්‍රීන් වන බව සහ ඊට සාපේක්ෂව පුරුෂයින් අඩු ප්‍රතිශතයක් සිටින බවයි. වැඩිහිටි නිවාසවල සිටින ස්ත්‍රී ජනගහනයට සාපේක්ෂව පුරුෂයින් වැඩි අගයක් ගැනීමට හේතු වශයෙන් ස්ත්‍රීන්ගේ ආයු අපේක්ෂාව වැඩි අගයක් ගැනීම පෙන්වා දිය හැකිය.

වැඩිහිටි නිවාසගත වී ඇති වැඩිහිටියන්ගේ ජනවාර්ගිකත්වය පිළිබඳ විමසා බැලීමේ දී අපට පෙනී යන්නේ දත්ත දායකයින් 66 දෙනාගෙන් 64ක්ම සිංහල වන අතර දෙමළ එක් අයෙක්ද, මුස්ලිම් එක් අයෙක්ද වශයෙන් හඳුනාගත හැකිය. එය ප්‍රතිශතයක් වශයෙන් සලකා බලන විට සිංහල ජාතිකයන් 97%ක් ද, දෙමළ ජාතිකයන් 1%ක් පමණ ද, මුස්ලිම් ජාතිකයන් 1%ක් පමණ ද වශයෙන් හඳුනාගත හැකිය.
වැඩිහිටි නිවාසගත වී සිටින පුද්ගලයින්ගේ වයස් කාණ්ඩ පිළිබඳ විමසා බැලීමේ දී පෙනී යන්නේ දත්ත දායකයින් 66 දෙනාගෙන් 56%ක් පමණ ප්‍රතිශතයක් එනම් දත්ත දායකයින්ගෙන් හරි අඩකටත් වඩා අවුරුදු 70ට වැඩි අය වන බවයි. ඒ අනුව 44%ක් පමණ ප්‍රතිශතයක් අවුරුදු 70ට අඩු අය වශයෙන් මෙහිදී හඳුනාගත හැකිය. එමෙන්ම අඩුම පුද්ගලයන් සංඛ්‍යාවක් අයත් වන වයස් කාණ්ඩය වන්නේ අවුරුදු 40-50 වයස් කාණ්ඩයයි. මේ අනුව පෙනී යන්නේ වැඩිහිටි නිවාසවල සිටින අයගෙන් වැඩි ප්‍රතිශතයක් අවුරුදු 70ට වැඩි අය වන අතර අවුරුදු 50ට අඩු අයගේ ප්‍රතිශතය ඊට සාපේක්ෂව අඩු අගයක් ගන්නා බවයි.

ප්‍රස්තාරය 2 : දත්ත දායකයින්ගේ අධ්‍යාපන මට්ටම





මූලාශ්‍රයඃ ක්ෂේත්‍ර පර්යේෂණය 2018

වැඩිහිටි නිවාසගතවී සිටින්නන්ගේ අධ්‍යාපන මට්ටම විමසා බැලීම ද මෙහිදී වැදගත් වෙයි. රැකවරණය අහිමි වීමෙන් වැඩිහිටි නිවාසයට පැමිණීමට ඔවුන්ගේ ආර්ථික තත්ත්වයේ ස්වභාවය කෙසේද යන්න හඳුනා ගැනීමට අධ්‍යාපන මට්ටම පිළිබඳ අවබෝධ කරගැනීම වැදගත් වෙයි. වැඩිහිටි

නිවාසගතවන්නන්ගේ අධ්‍යාපන මට්ටම පිළිබඳ විමසා බැලීමේ දී පැහැදිලි වන්නේ 6 ශේණියේ සිට 10 ශ්‍රේණිය දක්වා අධ්‍යාපනය ලැබූ අයගේ ප්‍රතිශතය 41%ක් වන අතර වැඩිම සංඛ්‍යාවක් මෙම 6 ශේණියේ සිට 10 වසර දක්වා ඉගෙනුම ලැබුවන් වන බවයි. එමෙන්ම අඩුම ප්‍රතිශතයක් (1.5%) සිටින්නේ උපාධි සහ ඩිප්ලෝමා දක්වා අධ්‍යාපන ලැබූ අයයි. එමෙන්ම 9%ක් පමණ සිටින්නේ කිසිදා පාසල් නොගිය අය වන බව ද හඳුනාගත හැකිය. දත්ත දායකයින්ගේ අධ්‍යාපන මට්ටම පිළිබඳ ඉහත 3 ප්‍රස්තාරය මඟින් දැක්වෙයි.

ප්‍රස්තාරය 3 : දත්ත දායකයාගේ රැකියාවක නියුතු වීම පිළිබඳ විග්‍රහය




මූලාශ්‍රයඃ ක්ෂේත්‍ර පර්යේෂණය 2018

දත්ත දායකයින්ගේ සමාජ ආර්ථික පසුබිම පිළිබඳ සලකා බැලීමේ දී පෙනී යන්නේ රැකියාවක් කරන ලද අය රැකියාවක් නොකළ අයට වඩා වැඩි නිසා ආර්ථික වශයෙන් ඉහළ මට්ටමක සිටින්නන් වැඩිහිටි නිවාසගත වීමේ ප්‍රවනතාවය සාපේක්ෂව වැඩි අගයක් ගන්නා බවයි.

වගු අංක 1 : දත්ත දායකයාගේ රැකියාවේ ස්වභාවය පිළිබඳ විග්‍රහය

| රැකියාවේ ස්වභාවය | සංඛ්‍යාතය | ප්‍රතිශතය |
|---|---|---|
| රැකියාවක් නොකළ අය | 16 | 24.2 |
| රාජ්‍යය අංශය | 11 | 16.7 |
| පෞද්ගලික අංශය | 16 | 24.2 |
| ස්වයං රැකියා | 10 | 15.2 |
| වෙනත් | 13 | 19.7 |
| එකතුව | 66 | 100.0 |


මූලාශ්‍රයඃ ක්ෂේත්‍ර පර්යේෂණය 2018

දත්තදායකයාගේ රැකියාවේ ස්වභාවය පිළිබඳ විමසා බැලීමේ දී පෙනී යන්නේ රැකියාවක් නොකරන ලද ප්‍රතිශතය 24.2%ක් වන බවයි. එමෙන්ම රැකියාවක් කරන ලද අයගේ ප්‍රතිශතය 75.8%ක් පමණ වන බවයි. මෙහිදී පැහැදිලි වන්නේ දත්ත දායකයින්ගෙන් හතරෙන් එකක් රැකියාවක් සිදුකර නැති බවත්, දත්ත දායකයින්ගෙන් හතරෙන් තුනක් පමණ රැකියාවක් සිදු කර ඇති බවත් ය. මෙම අංක 3 වගුවට අනුව පැහැදිලි වන්නේ රැකියාවක් කරන ලද 75.8%ක ප්‍රමාණය සලකා බලන විට එයින් 16.7%ක් රජයේ රැකියා ද, 24.2%ක් පෞද්ගලික අංශයේ රැකියා ද, 15.2%ක ප්‍රතිශතයක් ස්වයං රැකියා ද, එමෙන්ම 19.7%ක ප්‍රතිශතයක් වෙනත් අංශයන්හි රැකියාවල ද නිරත වී ඇති බවයි. මෙලෙස රැකියාවේ ස්වභාවය අනුව වෙනස් වෙනස් රැකියා අංශවල නිරත වී ඇති ආකාරයක් දැකගත හැකිය. මෙම දත්තවලට අනුව පෙනී යන්නේ පෞද්ගලික අංශයේ රැකියාවල නියුතු වූ අයගේ ප්‍රතිශතය මෙම නියැදියට අනුව වැඩි අගයක් ගන්නා බවයි.

අධ්‍යාපනය සහ රැකියාවේ ස්වභාවය අතර ඇති සම්බන්ධතාවය විමසා බැලීමේ දී පෙනී යන්නේ දත්ත දායකයින් 66 දෙනා අතරින් උපාධියක් හෝ ඩිප්ලෝමා සහිත පුද්ගලයින් එක් අයෙක් පමණක් සිටින අතරම ඔහු හෝ ඇය රජයේ රැකියාවක නිරත වී ඇති බවයි. එමෙන්ම කිසිදා පාසල් නොගිය

අය සලකා බැලූ විට පෙනී යන්නේ ඔවුන්ගෙන් එක් අයෙක් රැකියාවක් නොකරන ලද අතර දෙදෙනෙක් පෞද්ගලික අංශයේ රැකියාවන්ද, තුන් දෙනෙක් වෙනත් අංශවල රැකියාවන් ද සිදු කරන අය වන බවයි. එමෙන්ම 6 ශ්‍රේණියේ සිට 10 ශේණිය දක්වා ඉගෙනගත් අය වැඩිම සංඛ්‍යාවක් සිටින අතර ඔවුන්ගෙන් වැඩි දෙනෙක් පෞද්ගලික අංශයේ රැකියාවල නිරත වී ඇති බවයි.

ප්‍රස්තාරය 4 : දත්ත දායකයාගේ අදායම් මට්ටම පිළිබඳ විග්‍රහය





මූලාශ්‍රය: ක්ෂේත්‍ර පර්යේෂණය 2018

දත්ත දායකයින්ගේ ආදායම් මට්ටම පිළිබඳ විමසා බැලීමේ දී පෙනී යන්නේ රුපියල් 10000ට වඩා අඩු ආදායම්ලාභීන් 36.4%ක් වන බවයි. වැඩිම දත්ත දායකයින් ගණනකගේ ආදායම් මට්ටම රුපියල් 10000 - 2000 ත් අතර වන අතර එය ප්‍රතිශතයක් වශයෙන් 45.5%කි. එමෙන්ම 1.5%ක් අඩුම ප්‍රතිශතයක් රුපියල් 50000කට වඩා වැඩියෙන් ආදායම් ලබන අය වෙති. එය අඩුම දත්ත දායකයින් සංඛ්‍යාවක් සිටින ආදායම් මට්ටමයි. එමෙන්ම මෙම දත්ත දායකයින්ගෙන් 81.9%ක් පමණ ප්‍රතිශතයක් රුපියල් 10000කට වඩා අඩුවෙන් ආදායම් ලබන අය වෙති. එමඟින් පැහැදිලි වන්නේ වැඩිහිටි නිවාසගතවන්නන්ගේ ආදායම් මට්ටම ගත් විට 81.9%ක්ම රුපියල් 30000කට වඩා අඩු ආදායමක් ලැබුවන් වීම ද විශේෂත්වයකි. මන්ද පහෙන් එකක් පමණම මෙම ආදායම් මට්ටමට අයත් වන බැවින් ආර්ථික වශයෙන් ඉහළ ආදායම් මට්ටමක නොසිටි අය වැඩිහිටි නිවාසගත වී ඇති ආකාරයක් මෙම නියදියට අනුව දැකගත හැකිය.

දත්ත දායකයාට අයත්ව තිබූ දේපළ සහ වත්කම්වල ස්වභාවය අනුව ද අපට ඔහුගේ ආර්ථික පසුබිම පිළිබඳ අවබෝධ කරගත හැකිය. මෙහිදී ඔවුන් වැඩිහිටි නිවාසගත වීමට ආර්ථික පසුබිමේ පවතින වෙනස්වීම්හි යම් බලපෑමක් ඇති වී තිබේද යන්න අපට හඳුනාගත හැකිය.

ප්‍රස්තාරය 5 : දත්ත දායකයාගේ දේපළ හා වත්කම්වල ස්වභාවය





මූලාශ්‍රය: ක්ෂේත්‍ර පර්යේෂණය 2018

ඉහත අංක 6 ප්‍රස්තාරයට අනුව පැහැදිලි වන්නේ වැඩිහිටි නිවාසගතවන්නන්ගේ නියදියට අනුව දත්ත දායකයින්ගෙන් වැඩි ප්‍රමාණයක් කිසිඳු වත්කමක් හෝ දේපළක් හිමි නොවූ අය බවයි. එය 63.6%ක ප්‍රතිශතයක් ගන්නා අතරම දත්ත දායකයින්ගෙන් හරි අඩකටත් වඩා වැඩියෙන් දේපළ හා වත්කම් අහිමිව සිටි අය වශයෙන් හඳුනාගත හැකිය. ඔවුන්ගේ වත්කම් හා දේපල අහිමි වුවන් වීම නිසාම

මොවුන්ගේ ආර්ථික තත්ත්වය පහළ මට්ටමක තිබී ඇති අතරම එබැවින් අසරණභාවයට පත්ව වැඩිහිටි නිවාසයට පැමිණ ඇති ආකාරයක් දැකගත හැකිය. එමෙන්ම 6.1%ක් පමණ ප්‍රතිශතයක් දෙමාපියන්ගේ වත්කම් හා දේපළ හිමිව තිබූ අය වන අතර, 16.7%ක් පමණ ප්‍රතිශතයක් ඉඩම් හිමිවූවන් වී ඇත. එමෙන්ම වෙනත් වත්කම් හිමි අය 13.6%ක් වශයෙන් ද මෙහිදී හඳුනාගත හැකිය.

සමස්ත නියදියට අනුව ගත්විට වැඩිහිටි නිවාසගතවන්නන්ගේ ආර්ථික පසුබිම සහ පිලිබඳ විමර්ශනය කිරීමේ දී ඔවුන්ගේ දේපල හා වත්කම් ඔවුන් විසින් පරිහරණය කරන්නේ ද යන්න පිලිබඳ සොයා බැලීම ද වටනේ ය. මෙහිදී පැහැදිලි වන කරුණක් වන්නේ 68.2%ක් වන වැඩිම ප්‍රතිශතයකගේ දේපළ හා වත්කම් කිසිවෙකු විසින් පරිහරණය නොකරන බව අනාවරණය විමයි. තමන්ගේ වත්කම් හා දේපළ කිසිවෙකුත් පරිහරණය නොකිරීමට හේතු වශයෙන් දක්වන්නේ ඔවුන් විසින්ම එම දේපල විකුණා දැමීම හෝ අතහැර දැමීම යනාදියයි. එමෙන්ම තමන්ගේ දේපළ හා වත්කම් තමන් විසින්ම පරිහරණය කරනු ලබන වැඩිහිටි නිවාසගතවූවන් ද 3.0%ක් පමණ සිටින ආකාරයක් ද දැකගත හැකිය. 10.6%ක් වැඩිහිටි නිවාසගතවන්නන්ගේ සහෝදර සහෝදරියන් විසින්ද, 7.6%ක ප්‍රතිශතයක් දරුවන් විසින් ද, අනෙකුත් 10.6%ක ප්‍රතිශතයක් වෙනත් ඥාතීන් විසින් ද පරිහරණය කරනු ලබන බව මෙම නියදියට අනුව තවදුරටත් පසක් කරගත හැකිය. එමෙන්ම වැඩිහිටි නිවාසගතවන්නන් විසින් තමන්ගේ දේපළ හා වත්කම්වල ප්‍රතිලාභ භුක්ති විඳිනවාද නැද්ද යන්න පිළිබඳව විමසා බැලීම මඟින් ඔවුන්ගේ ආර්ථික තත්ත්වය පිළිබඳ අවබෝධ කරගත හැකිය.

ප්‍රස්තාරය 6 : දේපළ හා වත්කම්වල ප්‍රතිලාභ දත්ත දායකයා විසින් භුක්ති විඳීම




මූලාශ්‍රයඃ ක්ෂේත්‍ර පර්යේෂණය 2018

මෙහිදී අපට පැහැදිලි වන්නේ සමස්ත නියදියෙන් 95%ක ප්‍රතිශතයක් තමන්ගේ දේපළ හා වත්කම්වල ප්‍රතිලාභ භුක්ති විඳින්නේ නැති බවයි. තමන්ගේ දේපළ සහ වත්කම්වල ප්‍රතිලාභ භුක්ති විඳින්නේ සමස්ත නියන්දියෙන් 5%ක් වැනි ඉතාම කුඩා ප්‍රතිශතයක් වන බව ද දැකගත හැකිය. මින් පසක් වන්නේ දත්ත දායකයින්ගෙන් බොහෝ දෙනා තමන්ගේ දේපළ හා වත්කම්වල ප්‍රතිලාභ භුක්ති විඳීමට අවස්තාව අහිමි වීම නිසා වැඩිහිටි නිවාසගත වීමට සිදු වී ඇති බවයි. එමෙන්ම දත්ත දායකයින් පෙන්වා දෙන්නේ තමන්ගේ දේපළ හා වත්කම් තමා විසින්ම විකුණා දමා හෝ නැති කර ගැනීම නිසා පමණක් නොව තමන්ගේම සහෝදර සහෝදරියන්, දරුවන් හා වෙනත් ඥාතීන් විසින් දත්ත දායකයින්ගේ දේපළ හා වත්කම් භුක්ති විඳීම නිසා අසරණභාවයට පත්ව වැඩිහිටි නිවාසයට පැමිණීමට මඟ පෑදුන බවයි.

වගු අංක 2 ៖ දේපළ හා වත්කම්වල ප්‍රතිලාභ දත්ත දායකයා විසින් භුක්ති නොවිඳීමට හේතු

| හේතු | සංඛ්‍යාතය | ප්‍රතිශතය |
|---|---|---|
| දේපළ හා වත්කම් නොමැති | 37 | 56.1 |
| සහෝදර සහෝදරියන්ට දීම නිසා | 10 | 15.2 |
| දරුවන්ට ලබා දීම නිසා | 7 | 10.6 |
| වෙනත් ඥාතීන්ට ලබා දීම නිසා | 6 | 9.1 |
| වෙනත් හේතු නිසා | 4 | 6.1 |
| දේපළ විකුණා දැමීම නිසා | 2 | 3.0 |
| එකතුව | 66 | 100.0 |

මූලාශ්‍රයඃ ක්ෂේත්‍ර පර්යේෂණය 2018

දත්ත දායකයින්ට තමන්ගේ දේපළ හා වත්කම් පරිහරණය කිරීමට නොහැකි වීමට හේතු ගත් විට නියදියෙන් වැඩිම ප්‍රතිශතයක් එනම් 56.1%ක් පමණ තමාට කිසිඳු දේපළක් හෝ වත්කමක් නොමැති බව පවසති. එමෙන්ම 15.2%ක් තමන් සතුව තිබුණු වත්කම් තමන්ගේ සහෝදර සහෝදරියන්ට ලබා දීම නිසා ද, 10.6%ක් තමන්ගේ දරුවන්ට ලබා දීම නිසා ද, 9.1%ක් අනෙකුත් ඥාතීන්ට තමන්ගේ දේපළ හා වත්කම් ලබා දීම නිසා ද, 6.1% වෙනත් හේතු නිසා ද, තමන්ගේ දේපල හා වත්කම් විකුණා දැමීම නිසා 3.0%ක් දත්ත දායකයින්ගේ වත්කම් හා දේපළ ඔවුන් විසින්ම පරිහරණය නොකරන බව අනාවරණය විය. මෙහිදී පැහැදිලි වන්නේ දත්ත දායකයින්ගෙන් හරි අඩකටත් වඩා තමන්ට කිසිඳු දේපළක් හෝ වත්කමක් නොමැතිකම නිසා ප්‍රතිලාභයක් හිමි නොවන අය වන බවයි. ආර්ථික වශයෙන් පහළ මට්ටමක සිටින අය වැඩිහිටි නිවාසගත වී ඇත්තේ තනියම තමන්ට ජීවත් වීමට වත්කමක් හෝ හැකියාවක් නොමැතිකමිනි. එහිදී පැහැදිලි වන්නේ ආර්ථික පසුබිම පහළ මට්ටමක පැවතීම, තමන්ගේ දේපල හා වත්කම් අනෙකුත් අයට ලබා දීම සහ විකුණා දැමීම මෙන්ම වයස්ගත වීම නිසා සිදුවන විරැකියාව නිසා ආර්ථික සුරක්ෂිතතාවයක් නොමැතිව අසරණභාවයට පත්ව වැඩිහිටි නිවාසගත වී ඇති බවයි.

## 4. නිගමනය

වැඩිහිටි නිවාසගතවන්නන්ගේ ආර්ථික පසුබිම පිළිබඳ සමාජ විද්‍යාත්මක අධ්‍යයනයක් යන මැයෙන් සිදු කරන ලද මෙම අධ්‍යයනයේ දී පර්යේෂණ ක්ෂේත්‍රය ලෙස යොදාගත් මීරිගම සෙත්සෙවන රජයේ වැඩිහිටි නිවාසය, සුජාතා වැඩිහිටි නිවාසය සහ සහන උදය වැඩිහිටි විවේකාශ්‍රය යන වැඩිහිටි නිවාස ආශ්‍රයෙන් සිදු කරන ලද අධ්‍යයනයට අනුව ඒ සම්බන්ධව ප්‍රශස්ත නිගමනයන්ට පැමිණීමට හැකිවිය. වැඩිහිටි නිවාසගත වීමට ඔවුන්ගේ ආර්ථික පසුබිම බලපානවාද යන්න පිළිබඳ විමසා බැලීමේ දී ඔවුන්ගේ අධ්‍යාපන මට්ටම, රැකියාවේ ස්වභාවය, ආදායම් මට්ටම, මෙන්ම දේපළ හා වත්කම් පිළිබඳ සැලකිල්ලට ගන්නා ලදී.

ඉහළ සමාජ ආර්ථික තත්ත්වයක් හිමි වී තිබූ අයට සාපේක්ෂව රැකියාවෙන් මෙන්ම දේපළ හා වත්කම් සම්බන්දයෙන්ද පහළ තත්ත්වයක් තිබූ අය වැඩි වශයෙන් වැඩිහිටි නිවාසගත වී ඇති ආකාරයක් දැකගත හැකිය. මෙයින් පැහැදිළි වන්නේ වැඩිහිටි නිවාසගත වීමට ඔවුන්ගේ ආර්ථික සුරක්ෂිතතාවයක් නොමැති වීම හේතුවී ඇති ආකාරය යි. මේ නිසා රැකබලා ගැනීමට කිසිවෙකුත් නොමැති වැඩිහිටියන්ගේ ආර්ථික මට්ටම ස්ථාවරව පවත්වාගෙන යාමට මුල්‍යමය වශයෙන් ආධාර ලබාදෙන වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම වැදගත් ය.

## 5. ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


සමරකෝන්, එම්. (2005). *මූලික සමාජ විද්‍යාව 1 කොටස*, වැල්ලම්පිටියඃ ලස්සන ප්‍රකාශකයෝ.

සිල්වා, අයි. ඩී. (2008). 'ශ්‍රී ලංකාවේ වියපත් වන ජනගහනය සහ සමාජ ආරක්ෂණය'. *ආර්ථික විමසුම*, 4.

ලියනගම, ඩී. ඩී. (1993). 'ශ්‍රී ලංකාවේ වැඩිහිටි නිවාසගත වීමට බලපාන හේතු සාධක පිළිබඳ විමසුමක්'. *වැඩිහිටියෝ 1993 ජාත්‍යන්තර වැඩිහිටි සතිය විශේෂ කලාපය*, 41.

ජ්‍යෙෂ්ඨ පුරවැසි ප්‍රඥප්තිය හා ජාතික ප්‍රතිපත්තිය, සමාජ සේවා හා සමාජ සුභ සාධන අමාත්‍යාංශය (2006).

Brearley, C. P. (1990). *Working in Residential Homes for Elderly People*. London: Routledge Publishers.

Shrisgatharajah, T. (2004). *The Science of Caring for Elders*. Author Published.

Richards, H. J. (2011). The experiences of older adults from moving in to residential long term care; Asystematic review of qïlitative studies.

Tiffani, E. Milte, R. Crotty, M. Ratdliffe, J. (2017). Where's the evidence? a systematic review of economic analyses of residential aged care infrastructure. Health services research.

National survey on Elders. (2003-2004). National Secretariat for Elders of Ministry of Women's Empowerment and Social Welfare.